**සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පුද්ගලික) සමාගම - 2023**

**----------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පුද්ගලික) සමාගමේ (“සමාගම”) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරු වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරි සමාගමක සහය මා ලබා ගන්නා ලදි.

සමාගම 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධිත පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවධානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත,

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව

සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සහ
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| | විගණන ගැටලුව | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | **බැංකු ප්‍රකාශන සමඟ වෙන්කරවා ගැනීමේ අත්තිකාරම් සැසඳීම සඳහා ප්‍රමාණවත් සැසඳුම් ලේඛනයක් නොමැතිකම**<br><br>වෙන්කරවා ගැනීමේ අත්තිකාරම් ශේෂය තහවුරු කර ගැනීම සඳහා විගණන ක්‍රියා පටිපාටි සිදුකිරීමේදී, බැංකු ප්‍රකාශන සමඟ වෙන්කරවා ගැනීමේ අත්තිකාරම් සැසඳීම සඳහා සමාගම විසින් ක්‍රමවත් ලේඛනයක් නොපවත්වා ගෙන යන බව නිරීක්ෂණය විය. සපයා ඇති මූල්‍ය ප්‍රකාශනවලට අනුව, වෙන්කරවා ගැනීමේ අත්තිකාරම් ශේෂය රු. 1,307,540 කි.<br><br>ක්‍රමවත් සැසඳීමේ ලේඛනයක් නොමැතිකම සැලකිය යුතු අභ්‍යන්තර පාලන දුර්වලතාවයක් ඇති කරයි. බැංකු ගනුදෙනු සමඟ අනුරූපව වෙන්කරවා ගැනීමේ අත්තිකාරම් නිරන්තර සැසඳීමක් සිදු නොකිරීම හේතුවෙන්, වැරදි හෝ හඳුනානොගත් විෂමතාවයන් පැවතීමේ අවධානම ඉහළ යයි. මෙය මූල්‍ය වාර්තාකරණයේ සාවද්‍ය ප්‍රකාශනවලට තුඩු දිය හැකි අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවයටද බල පෑ හැකිය. | මේ මොහොතේ දී අපි අංක 324 දරණ ජංගම ගිණුම සැසඳීම සිදු කරනු ලබන්නේ වෙන්කරවා ගැනීමේ පද්ධතියෙන් ලබා ගන්නා තොරතුරු මඟින් සහ ඉතිරිය අතින් සිදු කර ලබා ගන්නා තොරතුරු මඟිනි. ලංකා බැංකුවේ සුහසාධක දෙපාර්තමේන්තුව විසින් සියලුම වෙන්කරවා ගැනීම් පද්ධතියක් හරහා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී. මෙම ක්‍රියාවලිය අවසන් වූ පසු, පද්ධතිය භාවිතයෙන් ජංගම ගිණුම සංසන්දනය කිරීමට අපට හැකි වනු ඇත. | සුදුසු පරිදි දෛනික, සතිපතා හෝ මාසික පදනමින් අත්තිකාරම් වෙන්කරවා ගැනීම සඳහා ක්‍රමවත් සැසඳීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කෙරේ. මෙම ක්‍රියාවලිය තුළින් බැංකු ප්‍රකාශනවලට එරෙහිව සිදු කරන ලද වෙන්කරවා ගැනීම් හරස් පරීක්ෂණයන්ට ලක් කිරීම තුළින් සියලුම ගනුදෙනු නිවැරදිව සටහන් කර ගිණුම්ගත කර ඇති බව සහතික කර ගත හැක. එසේ කිරීමෙන්, සමාගමට මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ හැකි අතර දෝෂ ඇතිවීමේ අවදානම අඩු කර ගත හැක. |

### 1.5.2 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| | විගණන ගැටලුව | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා සමාගම රුපියල් 3,348,255 ක ලාභයක් උපයා ඇති තිබුණ ද, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය දක්වාම සමාගම අඛණ්ඩව පාඩු ලබා ඇත. තවදුරටත් 2023 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුළු වගකීම් මුළු වත්කම් රුපියල් 64,230,049 කින් ඉක්මවූ අතර පෙර වසරේ (2022) එම මුදල රුපියල් 67,578,306 ක් විය.<br><br>තවදුරටත්, 2007 අංක 07 දරණ සමාගම් පනතේ 220 වැනි වගන්තියට අනුව සමාගම තදබල ප්‍රාග්ධන පාඩුවකින් පීඩිතව ඇත. | සමාගම විසින්ම තම සමාගමට මූල්‍යනය කිරීමට හැකිවන තෙක් මූල්‍ය සහය ලබා දීමට මවු සමාගම වන ලංකා බැංකුව එකඟවී ඇති අතර ඒ සම්බන්ධයෙන් සහනදායක ලිපියක්ද නිකුත් කර ඇත. | සමාගම විසින්ම ලාභ ලැබීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රුපියල් මිලියන 3.35 ක ලාභයක් වූ අතර පෙර වසරට අනුරූපව අලාභය රුපියල් මිලියන 2.49 ක් විය. එබැවින් රුපියල් මිලියන 5.84 ක ලාභයේ වැඩිවීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළ ලාභය වැඩිවීමට ප්‍රධානතම හේතුව වූයේ ආදායම සියයට 31.33 කින් ඉහළ යාමයි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

විගණනය සඳහා ලබා දී ඇති මූල්‍ය ප්‍රකාශන සහ තොරතුරු වලට අනුව, පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා වැදගත් අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| **විස්තරය** | **වර්ෂ** | |
|---|---|---|
| | **2023** | **2022** |
| **ලාභදායිතා අනුපාතය** | | |
| දළ ලාභ අනුපාතය (ප්‍රතිශතය) | 46 | 47 |
| ශුද්ධ ලාභ අනුපාතය (ප්‍රතිශතය) | 2 | (2) |
| මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | 0.14 | (5) |
| හිමිකම් මත ප්‍රතිලාභය අනුපාතය | (0.05) | (4) |
| **ද්‍රවශීලතා අනුපාතය (වාර ගණන)** | | |
| ජංගම අනුපාතය (වාර ගණන) | 0.28 | 0.21 |
| ක්ෂණික අනුපාතය (වාර ගණන) | 0.2 | 0.14 |

සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ඍණාත්මක රඳවාගත් ඉපැයීම් හේතුවෙන් සමාගමේ කොටස් මත ප්‍රතිලාභ අනුපාතය ඍණ අගයක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත් පෙර වර්ෂය හා සසඳන විට සමාගම තවමත් ප්‍රමාණවත් ද්‍රවශීලතා අනුපාත පවත්වා ගැනීමට අපොහොසත් වී ඇති අතර එය සමාගමේ කාරක ප්‍රාග්ධන ගැටලු හට ගැනීමට හේතු විය හැකිය.